# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2272/49 - 2022 මාර්තු මස 25 වැනි සිකුරාදා - 2022.03.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, දන්කොටුව (අදියර I) ජල සම්පාදන ව්‍යාපෘතියේ, කහටවිල ඝන මීටර් 2000 ක ජල කුළුණ ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත් කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/04/PX/478.
2022 මාර්තු මස 22 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
අංක 35,
"ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 465, තුලාවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තුලාවල ගමේ පිහිටි, ‘‘කොහිලගොඩැල්ල’’ නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 60 ක් පමණ වන ඉඩම් කොටස.

මායිම්

| | | |
|---|---|---|
| *උතුරට* | : | පෞද්ගලික ඉඩම ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | පෞද්ගලික ඉඩම ; |
| *බටහිරට* | : | ක්‍රීඩා පිටියක් ඉදි කිරීමට යෝජිත ඉඩම. |


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්* : 1. කේ. එල්. සී. කේ. කරුණානායක මහතා,
කොහිළගොඩැල්ල,
තුලාවල.

2. කේ. එල්. එම්. කේ. කරුණානායක මහතා,
කොහිළගොඩැල්ල,
තුලාවල.

EOG 3 - 1004

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, බටවල නිව්ලෑන්ඩ්ස් ජල ගබඩා ටැංකියට ප්‍රවේශ මාර්ගය සඳහා ඉඩම් කොටසක පරවශතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උප ලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/04/KE/476.
2022 මාර්තු මස 22 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

**උපලේඛනය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 27 - අලුත් නුවර ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, අලුත් නුවර ගමේ පිහිටි නිව්ලෑන්ඩ්ස් වත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 40ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටසඃ

කැබලි අංක : 1

*උතුරට* : එම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : එම ඉඩමේ ඉතිරි කොටස;
*දකුණට* : එම ඉඩමේ ඉතිරි කොටස;
*බටහිරට* : එම ඉඩමේ ඉතිරි කොටසම.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : 1. කෑගල්ල වැව්ලි සමාගම,
අඹදෙනිය වත්ත,
අරණායක.

EOG 3 - 1005

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.